# ජාත්‍යන්තරයේ නූතන ප්‍රවණතා පිළිබඳ සම්මන්ත්‍රණ මාලාවක්



ශ්‍රී ලංකාවේ හිටපු ඇමෙරිකානු තානාපති සහ මැක්ලැන්ටි ඇසෝසියේෂන් හි ඉන්දියාව හා දකුණු අසියාව භාර අධ්‍යක්ෂවරයා වශයෙන් වර්තමානයේ කටයුතු කරන රොබට් ඕ බ්ලේක් මහතා පසුගියදා මෙරටට පැමිණියේය.

පාත්ෆයින්ඩර් පදනමේ ආරාධනයක් අනුව පැමිණි ඒ මහතා ''ඇමෙරිකානු ප්‍රතිපත්ති චීනය, දකුණු ආසියාව හා ශ්‍රී ලංකාවට'' යන මැයෙන් විශේෂ දේශනයක් කොළඹ දී පැවැත්වීය. පාත්ෆයින්ඩර් පදනම සහ ඒකාබද්ධ ඇඟළුම් සංගම් සංසදය සහයෝගීතාවයෙන් එය සංවිධානය කළ අතර, විද්වත් ආරාධිතයෝ පිරිසක් එයට සහභාගි වූහ. ජාත්‍යන්තරයෙහි සිදුවන නූතන සංවර්ධන ප්‍රවණතා සලකා බලන සම්මන්ත්‍රණ මාලාවක දෙවැන්න වන අතර, එම සැසිවාරයට කලින් පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා සමඟ සාකච්ඡා කළ අවස්ථාව ඡායාරූපයේ දැක්වෙයි.